# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2268/88 - 2022 පෙබරවාරි මස 25 වැනි සිකුරාදා - 2022.02.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (X) (බී)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25(අ) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය, දිනේෂ් ගුණවර්ධන වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත කර ඇති, ලියාපදිංචි අංක පී. වී. 72548 දරන සීගීස් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වන වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මේ නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2021 ජනවාරි 22 වැනි දින අංක 2211/69 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ II වන උපලේඛනය, එහි I වන තීරයේ දැක්වෙන "අලෙවිකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව" යන සටහනට හා එහි II තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින්, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

### I වන උපලේඛනය

***කොන්දේසි***

1. සීගීස් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාවන් සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී, පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව, මෘදුකාංග ඉංජිනේරු පිළිබඳ විද්‍යාවේදී ගෞරව සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි සඳහා -

(අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී භෞතික විද්‍යාව විෂය ධාරාව යටතේ සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (03) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම ; හෝ



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) නිශ්චිත බලධරයා විසින් අනුමත කරන ලද එයට ඇඳුනු පාඨමාලාවක් සමග ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ඕනෑම විෂය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (03) එකවර ලබා තිබීම.

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පිරිනැමීම සඳහා සීජීස් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය පිළිගනු ලැබිය යුතු ය.

## II වන උපලේඛනය

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බීඑස්සී ගෞරව (පරිගණක විද්‍යාව) |
| මෘදුකාංග ඉංජිනේරු පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බීඑස්සී ගෞරව (මෘදුකාංග ඉංජිනේරු) |
| තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බීඑස්සී ගෞරව (තොරතුරු තාක්ෂණය) |

දිනේෂ් ගුණවර්ධන,
අධ්‍යාපන අමාත්‍ය.

2022 පෙබරවාරි මස 23 වැනි දින,
කොළඹ දී ය.

EOG 02 - 0660

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.